# මාඝ ආක්‍රමණය සහ පොළොන්නරු රාජධානිය බිඳවැටීම

## Invasion of Kalinga Magha and Decline of the Polonnaruwa Kingdom

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්දන අබේරත්න

**Abstract**

The Polonnaruwa Kingdom, which prevailed more than two centuries declined due to the invasion of Kalinga Magha who came from India. Although his name itself imply that his motherland was Kalinga, modern Orissa, but historical sources say that his army consisted of Kerala and Malala soldiers. Vijayabahu I, Parakramabahu I and Nissankamalla of the kingdom was powerful, but since the death of Nissankamalla, the rulers who obtained the throne by assassinating or dethroning one another within a short period, created unstable political situation all over the country. Meanwhile the struggle between the Pandya and Kalinga royal families led to weaken the political, economic, social and religious stability of the country. At the same time the powerful commanders of the army tried to make puppet rulers over the throne and rule the country. Under this situation the path was opened to Kalinga Magha to invade Sri Lanka and to dispel Parakrama Pandya, who was ruling in Polonnaruwa. After obtaining power, Magha behaved like a tyrannical ruler and his crudeness caused to destroy the ordinary situation of the country. The most important thing is that none of the invaders who invaded the country earlier haven't act like Kalinga Magha. The destruction made by

him finally led the kingdoms of the dry zone declined and decentralization the ruling centers to the South- Western region.

**Keywords.** Polonnaruwa kingdom, Kalinga Magha, dry zone, decentralization, south-western region

පොළොන්නරු රාජධානි සමය මෙන්ම රජරට රාජධානි සමය ද අවසන් කරමින් ක්‍රි.ව. 1215 දී එල්ල වූ කාලිංග මාඝගේ ආක්‍රමණය පිළිබඳව මෙරට මූලාශ්‍රයවල අන්තර්ගත තොරතුරු, විශ්වසනීයත්වයෙන් ඉහළ තත්වයක පවතින බව පෙනී යයි. විශේෂයෙන් ම පූජාවලී කතුවන බුද්ධපුත්‍ර හිමියන් අදාළ සිදුවීම් අත්දකින්නට ඇති බව පැහැදිලි ය. මෙම සිදුවීම් ඉදිරිපත් කරන මහාවංසයේ අදාළ කාල පරිච්ඡේදය සම්පාදනය කළ ලේඛකයා ද සිදුවීමේ සාක්ෂ්‍යකරුවකු හෝ ඊට ඉතා ආසන්න වකවානුවක ජීවත් වූ අයකු විය යුතු ය.

පූජාවලී කතුවරයා මාඝ ආක්‍රමණය පිළිබඳ දක්වන්නේ, "පසුව ලංකාවාසීන්ගේ කිසියම් දරුණු වූ අකුශලකර්මයක් හේතු කොටගෙන ලක්දිව මහේසාක්‍ය ආරක්ෂක දෙවියන්ගේ කිසියම් උපේක්ෂාවක් විද්‍යමාන වූ කල්හි අබෞද්ධයන්ගේ උත්සන්නභාවයක් පහළ වූ කල්හි මාඝරාජ නම් කළිඟුරජ සූවිසි දහසක් මලල සෙනඟ ගෙන ලක්දිව් බැස කඳවුරු බැඳ නුවර ගෙන පඬිරජහු ඇස් උදුරුවා ලෝකශාසනය ද නසා රුවන්වැලි මහසෑය බිඳුවා සෙසු දහස් ගණන් දාගැබ් බිඳුවා නොයෙක් ශ්‍රද්ධාවන්ත රජුන්ගේ චෛත්‍ය නමැති කීර්තිශරීරවල කොත් නමැති ඔටුණු හා රුවන් නමැති හෘද්මාංස ගෙන ධාතු නමැති ජීවිත අන්තර්ධාන කරවා සංඝාරාම ආයතන් මහපා දෙමළුන්ට වාසස්ථාන කරවා ලක්දිව කුලස්ත්‍රීන්ගේ ජාතිසම්භේද කොට කුලදරුවන් සීවැසි කරවා සිරිලක මිථ්‍යාදෘෂ්ටි ගන්වා සුඛිතයන්ගේ ධන විචාරයෙහි හස්තපාදාදිඡේදනයෙන් විකාරයට පමුණුවා ලංකාද්වීපය ගිනිගත් ගෙයක් සේ කරවා ගම දෙමළුන් ලවා බලාත්කාරයෙන් එකුන්විසි හවුරුද්දක් රාජ්‍යය කෙළේ ය" යනුවෙනි. (පූජාවලිය, 2014, පි. 508)

මහාවංසයේ අදාළ කොටසේ අන්තර්ගතය ද පූජාවලී විස්තරයට බෙහෙවින් ම සමාන බව පෙනේ. නමුත් එය පූජාවලියට වඩා විස්තරාත්මක ය.

"ඉක්බිති ලංකාවාසීන්ගේ කිසියම් රෞද්‍ර වූ පාපකර්මයක් උත්සන්න වූ කල්හි, ලංකාව ආරක්ෂා කිරීමෙහි නිරත වූ දේවතාවන් ඒ ඒ තන්හි ආරක්ෂක විධි සැලසීමට උපේක්ෂා සහගත වූ කල්හි මිථ්‍යාදෘෂ්ටි සමාදන් වූ දුර්නීතියෙහි නිරත අදහස් ඇති, දානාදී කුසල් වනගොමු දවන ලැව්ගින්නක් බඳු වූ, සදහම් කුමුදු රැස හකුළන සූර්යයා බඳු වූ, ක්ෂාන්ති නමැති පියුම් පෙළෙහි කැළුම් වනසන චන්ද්‍රයා වැනි, මහාමෝහයෙන් මුළා වූ විචාරණ ඇති, කාලිංග වංශයෙහි උපන්, එක් අධාර්මික, මාඝ නම් රජෙක් සූවිසි දහසක් යෝධයන්ට අධිපතිව කාලිංග දේශයෙන් ගොඩ බැස ලංකාද්වීපය අත්පත් කර ගත්තේ ය. මාඝරාජ නමැති මහා ග්‍රීස්මය, ලංකා රාජ්‍යය නමැති මහවනය පෙළීම සඳහා යෝධයන් නමැති ලැව්ගිනි යෙදවී ය. අනතුරුව ලෝකයට පීඩා කරන, කෲර වූ ඔහුගේ යෝධයෝ අපි කේරළ යෝධයෝ වම්හයි තන්හි තන්හි මහ හඬ නගමින් මිනිසුන්ගේ ඇඳුම් පැළඳුම් ආදිය පැහැර ගත් හ. බොහෝ කල් රක්නා ලද කුල සිරිත් බිඳ දැමූහ. අත් පා සිඳලූහ. බොහෝ මන්දිර බිඳලූහ. ගව මහිෂාධීන් තමන් අයත් කොට බැඳ ගත් හ. ආඪ්‍ය වූ මහත් ධනය ඇති ජනයා බැඳ වධයට පමුණුවා සියලු ධනය පැහැරගෙන දිළින්දන් බවට පත් කළහ. පිළිම ගෙවල් බිඳ දැමූහ. බොහෝ චෛත්‍ය විනාශ කළහ. විහාරවල වාසය කළහ. උපාසකයන්ට පහර දුන්හ. දරුවන්ට තැලූහ. පඤ්ච සහධම්මිකයන් පෙළුහ. ජනයා ලවා බර ඇද්දවූහ. බොහෝ වැඩ කරවූහ. ඔවුහු ප්‍රසිද්ධ, ප්‍රශස්ථ බොහෝ පොත් රැහැනින් මුදා තැන තැන විසිරවූහ. ශ්‍රද්ධාවන්ත පූර්ව රජුන්ගේ කීර්ති ශරීර බඳු රුවන්වැලි ආදී උතුම් මහත් චෛත්‍ය බිඳ වනසා ඔවුන්ගේ ජීවිත වැනි බොහෝ ශාරීරික ධාතූන් වහන්සේලා අහෝ අතුරුදන් කළහ. මෙසේ මාර යෝධයන් අනුකරණය කළ, දුෂ්ට සිත් ඇති ඒ දමිළ යෝධයෝ ලෝකය ද සාසනය ද නැසූහ. ඉක්බිති පුලස්තිපුර සර්වප්‍රකාරයෙන් වටලා පරාක්‍රම පාණ්ඩ්‍ය රජු අල්ලා ගත් හ. ඉක්බිති ඒ රජුගේ ඇස් උගුළුවා මුතු, වෙරළුමිණි ආදී සියලු

ධනය පැහැර ගත් හ. අනතුරුව මාණාභරණ ප්‍රමුඛ යෝධයෝ ඒ කාලිංගමාඝ ලංකා රාජ්‍යයෙහි අභිෂේක කළහ. මෙසේ මාඝ රජු රට අත්පත් කොට, රාජ්‍යයෙහි අභිෂේක ලබා පුලස්ති නගරයේ විසී ය. ඒ රජු මහජනයා මිසදිටු ගන්වා අසංකීර්ණ වූ චතුර්වර්ණය බොහෝ සේ සංකීර්ණ කළේ ය. සිංහලයන්ට අයත් ගම්, කෙත් වතු, නිවාස, ගව මහිෂාදී සියල්ල ම කේරළයන්ට දෙවී ය. විහාර ද, පිරිවෙන් ද, බොහෝ ආයතන ද, කිසියම් හෝ යෝධයන්ගේ වාසය පිණිස පැවරීය. ඔහු (මාඝ) බුදුන්, දහම්, සඟුන් සතු ධනය පැහැරගෙන නිරයට යාම පිණිස බොහෝ පව් උපදවා ගත්තේ ය. මෙසේ මාඝ රජු බලාත්කාරකම් කොට විසි එක් වසක් ලංකා රාජ්‍යය කළේ ය". (ඌනපූරණසහිතො මහාවංසො. 1959, 78; 54-79.)

එවමෙව බලක්කාරං කත්වා මාඝමහීපති

එකවීසතිවස්සානි ලංකාරජ්ජමකාරයී.

(ඌන.පූ.ස.ම.ව.78; 79)

කාලිංග මාඝගේ ආක්‍රමණය පොළොන්නරු රාජධානිය බිඳවැටීම කෙරෙහි විශාල දායකත්වයක් දක්වන නමුදු, රාජධානිය බිඳවැටීම කෙරෙහි බලපෑ තවත් සාධක පවතී. ඒ අතුරින් ප්‍රධාන වන්නේ නිශ්ශංකමල්ලගේ පාලන සමයේ සිටම පැවති දේශපාලන ව්‍යාකුලත්වය යි. කාලිංග සහ පාණ්ඩ්‍ය වංශ අතර පැවති බල අරගලයත්, එනිසාම දුර්වල රජුන් සිංහාසනයට පත්වීම සහ සේනාපතිවරුන් බලවත් වී තමනට අවශ්‍ය පරිදි රජුන් මෙහෙයවීමත් මෙම වකවානුවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

නිශ්ශංකමල්ලගේ අනුප්‍රාප්තිකයා වූ ඔහු පුත් වීරබාහු (ක්‍රි.ව. 1196) සිහසුනට පත් වී දිනකින් මරා දමන ලද්දේ තාවුරු සෙනෙවිරත් විසිනි. පූජාවලියට අනුව ඔහු නිශ්ශංකමල්ලගේ අතිජාත පුත්‍රයෙක් නොවී ය. නමුත් නිශ්ශංකමල්ලගේ සෙල්ලිපිවලට අනුව වීරබාහු අතිජාත පුත්‍රයෙකි. (E.Z.Vol.II.1912-1927. p. 77) මෙම තාවුරු සෙනෙවිරත් යනු නිශ්ශංකමල්ලගේ ම ප්‍රධාන සෙන්පති වූ ලක්විජයසිඟු සෙනෙවි තාවුරුනා විය හැකි බවට මත පළ වී ඇත. (ලං.වි.වි. ලංකා ඉතිහාසය, 1972, පි.491)

වීරබාහුට පසු නිශ්ශංකමල්ලගේ කණිටු සොහොයුරෙක් වූ ඒරපත්ත හෙවත් දෙවන වික්‍රමබාහු (ක්‍රි.ව. 1196) සිහසුන් පත් වුව ද ඔහුට ද මාස තුනක් වැනි ඉතා කෙටි කලකින් සිහසුන අහිමි වී ය. දෙවන වික්‍රමබාහු මරා දමා කාලිංග වංශිකයකු ම වූ චෝඩගංග (1196-1197) සිහසුන පැහැර ගත්තේ ය. ඔහු නිශ්ශංකමල්ලගේ සහෝදරියකගේ පුත්‍රයෙකි. නමුත් ඔහුට ද වැඩි කලක් බලයේ සිටීමට නොහැකි වූ අතර, සිහසුන් පත් වී නව මසකින් කිත්ති නම් සෙනෙවියෙක් චෝඩගංග බලයෙන් පහකොට බලය සියතට ගෙන, පළමුවන පරාක්‍රමබාහු රජුගේ අගමෙහෙසිය වූ ලීලාවතී බිසොව (1197-1200) සිහසුනට පත් කළේ ය. ඇය පාණ්ඩ්‍ය වංශයට අයත් වූ බැවින් ලීලාවතී රැජිනගේ රාජ්‍ය ප්‍රාප්තිය කාලිංග වංශයේ බලය යටපත් කිරීමට ඉවහල් වන්නට ඇත. නමුත් කාලිංග පාර්ශවය විසින් ඇයගේ අගමැතිවරයා වූ කීර්ති සෙනෙවියා බලයෙන් පහකරන ලද බැවින් ලීලාවතී රැජිනගේ පළමු පාලන සමය වසර තුනකින් නිමා විය.

ලීලාවතී රැජින බලයෙන් පහකොට කාලිංගයෙන් පැමිණි කුමරකු වූ සාහසමල්ල (1200-1202) රජ වූ අතර ඔහුට ලංකා රාජ්‍යය භාරගන්නා ලෙස මෙරට ඇමතිවරුන් ඉල්ලා සිටි බව කියැවේ. ඔහු නිශ්ශංකමල්ලගේ වෛමාතික සහෝදරයෙකි. ලංකාධිකාර ලොලුපැලෑකුළු දුත්තැටි ආබෝනා සහ ලංකාධිකාර ලොලුපැලෑකුළු බුදල්නා යන ඇමතිවරු සාහසමල්ලට මෙරට සිහසුන භාරගන්නා ලෙස ඉල්ලා සිටි බව කියැවේ. ඔහුගේ පාලන සමය ද වියවුල් ගහන සමයක් වූ අතර වසර දෙකකට පසුව ආයස්මන්ත නම් සෙනෙවියෙක් සාහසමල්ල බලයෙන් පහකොට නිශ්ශංකමල්ලගේ මෙහෙසියක වූ කල්‍යාණවතී බිසොව (1202-1208) සිහසුනට පත් කළේ ය. ඇය ද කාලිංග වංශයට අයත් වූ අතර ඇයගේ රාජ්‍ය කාලය වසර හයක් විය.

ආයස්මන්ත සෙනෙවියා විසින් ම කල්‍යාණවතී රැජින බලයෙන් පහකොට ධර්මාශෝක (1208-1209) නම් තුන්මසක් වයසැති ළදරු කුමරකු සිහසුනේ තබා පාලනය ගෙන ගියේ ය. නමුත් ආයස්මන්ත සෙනෙවිට එරෙහි බලවේගවල සහායෙන්

අනීකංග (1209) නම් චෝළ දේශයේ සිට හමුදාවක් රැගෙන පැමිණි අයෙක් ආයස්මන්ත මරා රාජ්‍යය ලබා ගත්තේ ය. ඔහු ධර්මාශෝක කුමරුගේ පියා බවට සාධක පූජාවලියෙන් ලැබේ. (පූජාවලිය, පි. 507)

රජකමට පත් වී දින දහහතකින් වික්කන්ත චමූනක්ක නම් සෙනෙවියකු විසින් අනීකංග මරා දමා නැවත ලීලාවතී බිසොව (1209-1210) සිහසුනට පත් කරන ලදී. නමුත් පාණ්ඩ්‍ය වංශික ලීලාවතී රැජිනට මෙවර සිහසුන දැරීමට හැකිවූයේ වසරක කාලයක් පමණි. කාලිංග වංශික ලෝකේශ්වර (1210-1211) නමැත්තා සේනාවක් රැගෙන පැමිණ ඇය සිහසුනෙන් පහකොට බලය පැහැර ගත්තේ ය.

පරාක්‍රම නම් සේනාපතියකුගේ සහාය ලැබූ ලීලාවතී බිසොව (1211-1212) තෙවන වරටත් සිහසුනට පත් වූවා ය. නමුත් මාස හතක් ගත වූ පසු පරාක්‍රම පාණ්ඩ්‍ය (1212-1215) නම් කුමාරයෙක් ලංකාව ආක්‍රමණය කොට සිහසුන පැහැර ගත්තේ ය. ඔහු බලයෙන් පහ කරමින් කාලිංග මාඝ (1215-1236) විසින් ලංකාව අත්පත් කරගැනීම ව්‍යාකූලතා මැද පැවති පොළොන්නරු රාජධානියේ බිඳවැටීම සනිටුහන් කරයි.

මෙසේ අස්ථාවර දේශපාලන තත්ත්වයක් රටේ පැවතීම, ආර්ථික ස්ථාවරභාවයට ද විශාල අයහපත් බලපෑමක් ඇති කරන්නට ඇත. එම තත්ත්වය ආක්‍රමණිකයකුට පහසුවෙන් මෙරට බලය අත්පත් කර ගන්නට මහත් පිටිවහලක් වන්නට ඇති අතර දුක්ඛිත තත්ත්වයකට වැටී සිටි මෙරට සාමාන්‍ය ජනයාට, ප්‍රභූන්ට පමණක් නොව භික්ෂූන් වහන්සේලාට ද මෙම අවස්ථාවේ බිහිසුණු අත්දැකීමකට මුහුණ පාන්නට සිදු වූ බව මූලාශ්‍රය අනුව පැහැදිලි ය.

මාඝගේ ආක්‍රමණය ඊට පෙර මෙරටට එල්ල වූ ආක්‍රමණවලට වඩා විශේෂ වූ බව පෙනී යයි. අනුරාධපුර යුගයේ මුලින් ම එල්ල වූ ආක්‍රමණය ලෙස සැලකෙන සේන ගුත්තික දෙදෙනාගේ ආක්‍රමණය ගැන මහාවංසයේ දැක්වෙන්නේ ඔවුන් දැහැමි පාලකයන් බව යි.

අස්සනාවිකපුත්තා ද්වෙ දමිළා සේනගුත්තිකා
සූරතිස්ස මහීපාලං තං ගහෙත්වා මහබ්බලා
දුවෙ වීසතිවස්සානි රජ්ජං ධම්මෙන කාරයුං
(ම.ව. 21; 10-11)

එළාර රජුගේ ආක්‍රමණය පිළිබඳව වංසකථාගත ප්‍රවෘත්තිවලට අනුව ඔහු ද ඍජු දැහැමි පාලකයෙකි. අධිකරණ කටයුතුවලදී ඔහු මිතුරනට මෙන් ම සතුරන්ට ද මධ්‍යස්ථව කටයුතු කර ඇත. එපමණක් නොව ඔහුගේ දැහැමි බව තහවුරු කෙරෙන දීර්ඝ විස්තරයක් මහාවංස සම්පාදක මහානාම හිමියන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව සාධාරණය අපේක්ෂා කරන ජනයාට පහසුවෙන් රජුට පැමිණිලි ඉදිරිපත් කරනු පිණිස යහනේ හිස පැත්තෙහි දිගු රැහැණක් සහිත සණ්ටාරයක් එල්ලා තිබුණි. එළාරගේ පුත්‍රයාගේ රථයේ හැපී වසුපැටවකු මරණයට පත් වූ බවත්, පැටවාගේ මව් ගවදෙන සණ්ටාරය නාද කළ අතර නඩුව විභාග කළ රජු ස්වකීය පුත්‍රයා ද එම රථයට ම යටකොට මරණ දඬුවමට ක්‍රියාත්මක කළේ ය. (ම.ව.21; 13-20)

එළාර රජු තෙරුවන් ගුණ නොදන්නා නමුදු පෙර සිරිත් අනුගමනය කරමින් චේතිය පර්වතයේ භික්ෂූන් වහන්සේලාට දානයට ආරාධනා කළ බව ද වංසකථාවේ දැක්වේ. (ම.ව.21; 21-22) එමෙන් ම වරක් එක් මහලු මවක් වී වේළා ගැනීමට අව්වට දමා තිබූ අතර හදිසියේ වට වැස්සකින් වී තෙමී ගිය නිසා ඇය එළාර රජුට ඒ ගැන පැමිණිලි කළා ය. රජු ධර්මයෙහි පිහිටා මහලු මවට සාධාරණය ඉටු කරනු වස් උපවාසයක් ආරම්භ කළ අතර මෙය දැන ගත් ශක්‍ර දෙවියන් වැස්සට අධිපති පජ්ජුණ්ණ දෙවියන් කැඳවා සුදුසු කාලයෙහි පමණක් වැසි වස්වන ලෙස උපදෙස් දුන් බව ත්, එතැන් සිට එළාර රජුගේ රාජධානියට දහවල් කාලයේ වැසි නොවැස්ස බවත් සඳහන් ය. (ම.ව.21; 27-32)

මීට පසුව එල්ල වූ ආක්‍රමණ අවස්ථාවලදී වුව ද මාඝ ආක්‍රමණයේදී සිදු වූ ආකාරයට භික්ෂූන් වහන්සේට හෝ බුදු දහමට හානියක් වූ බවක් මූලාශ්‍රයවල නොදැක්වේ. වළගම්බා සමයේ මෙරට ආක්‍රමණය කළ දමිළයන් සත් දෙනාගෙන් එක්

අයෙක් බුදුන් දන් වැළඳූ පාත්‍රය රැගෙන එයින් සතුටට පත්ව ආපසු යාමෙන් පෙනී යන්නේ ඔහු බෞද්ධයකු වන්නට ඇති බව යි.

එකො පත්තං දසබලස්ස අනුරාධපුරෙ ඨිතං
ආදාය තෙන සන්තුට්ඨො පරතීරමගාලහුං
(ම.ව. 33; 56)

ඒ අනුව මාඝගේ ආක්‍රමණයේ ස්වභාවය විශේෂත්වයක් ගන්නා බව පැහැදිලි ය. එනම්, ජනයාගේ ධනය පැහැර ගැනීම ආක්‍රමණයකදී සාමාන්‍ය දෙයක් වුව ද, නිරායුධ ජනයාගේ අත් පා කපා දැමීම විශේෂත්වයක් වන්නේ එතෙක් පෙරදිග පැවති යුද ආචාර ධර්මවලට අනුව නිරායුධ අයකුට පහර දීම නොකළ යුතු ය යන්න පිළිගත් සම්ප්‍රදායයක්ව පැවති බැවිනි.

මීට පෙර මෙරට ආක්‍රමණය කළ ඇතැම් ආක්‍රමණිකයන් විහාර සන්තක දේපොළ පැහැර ගත් නමුත් මාඝ විසින් සිදු කරන ලද, පිළිම ගෙවල් බිඳ දැමීම, චෛත්‍ය විනාශ කිරීම, පඤ්ච සහධම්මිකයන් (භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, සික්ඛමානා) පෙළීම, ස්තූප බිඳ ඒවායේ නිධන් කොට තිබූ සර්වඥ ධාතූන් වහන්සේලා අතුරුදන් කිරීම සිදු නොවී ය. එමෙන් ම ප්‍රසිද්ධ, ප්‍රශස්ථ පොත් පත් රැහැණින් මුදා තන්හි තන්හි විසුරුවීම එතෙක් පෙරදිග පැවති ආගමික සහනශීලතාව බරපතල ලෙස නොතකා හැරීමකි. මෙම පුස්කොළ පොත් විනාශය මෙරට මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු වූ දැවැන්ත ම දැනුම විනාශ වීම ලෙස සැලකිය හැකි ය. එම ග්‍රන්ථවල තිබූ පාරම්පරික දැනුම විශේෂයෙන් ම වෛද්‍ය ශාස්ත්‍රීය දැනුම, තාක්ෂණික ඥානය සහ වෙනත් ශිල්පීය ඥාන සම්භාරය මෙරටට පමණක් නොව සමස්ත මානව වර්ගයාට ම අහිමි වී යන්නට ඇත.

තෙවන විජයබාහු රජු විනාශ වූ ධර්ම ග්‍රන්ථ නැවත ලේඛනගත කිරීමට කටයුතු කළ ද එහිදී පෙර සඳහන් කළ දේශීය දැනුම් සම්භාරය නැවත ලේඛනගත වී ය යි සැලකිය නොහැකි ය. (ම.ව. 79; 41-44)

මාඝ විසින් මහජනයා මිථ්‍යාදෘෂ්ටි ගැන්වීම ඇතුළු සාසනයට හානි සිදු කිරීම පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරන මහාචාර්ය ලියනගමගේ මහතාගේ අදහස වන්නේ, මාඝ වීරශෛව වාදය පිළිගත්තකු හෝ අවම වශයෙන් එහි බලපෑමට ලක්වූවකු වන්නට ඇති බව යි. (ලියනගමගේ, අමරදාස. මධ්‍යකාලීන ලංකා ඉතිහාසය, 2002, පිටු. 187-200.)

මෙසේ දේශපාලන, ආගමික, ආර්ථික සහ සමාජ සංස්කෘතික සියලු ක්ෂේත්‍රවල සිදු වූ බිඳවැටීම් නිසා වර්ෂ 1600 කට අධික කාලයක් විරාජමානව පැවති රජරට රාජධානි අවසන් ව රාජධානි නිරිතදිගට විකේන්ද්‍රණය සිදු විය. මාඝ පාලන සමයේ ඇතැම් ප්‍රාදේශීය පාලකයන් දුර්ග පර්වත ස්ථානවල යම් ආකාරයක ස්වාධීන පාලන මධ්‍යස්ථාන කීපයක් පවත්වා ගෙන ගිය බව මූලාශ්‍රයාගත තොරතුරුවලින් පැහැදිලි ය.

ඒ අනුව සුභ නම් සෙන්පතියා සුභපබ්බතය (යාපහුව) කේන්ද්‍ර කරගනිමින්, ආලකමන්දාව බඳු පුරයක් ඉදිකොට, කේරළ රාක්ෂස සේනා වළක්වමින් සාසනය ද, එම ප්‍රදේශය ද ආරක්ෂා කළේ ය.

පුරං ආලකමන්දංව කත්වා වෙස්සවණො විය
සුභසෙනාපතී තත්ථ වසං කෙරළරක්ඛසෙ
වාරෙන්තො පරිපාලෙසී තං දිසං තඤ්ච සාසනං
(ම.ව. 79; 1-4)

සතුරන්ට ළඟා විය නොහැකි ගෝවින්ද පර්වතය (ගෝවින්ද මලය, ගොවිඳුහෙළ) මුදුනෙහි පුරයක් ඉදිකොට භුවනෙකබාහු නම් ආදිපාදවරයා රෝහණය පාලනය කරමින් සාසනය ද භික්ෂු සංඝයා ද ආරක්ෂා කළේ ය.

දුරාසදෙ විරොධීනං ගොවින්දාචලමත්ථකෙ
පුරං කත්වා නිසීදන්තො භුවනෙ සුතවික්කමො
භුවනෙකභුජො නාම ආදිපාදමහීපතී
පාලෙසි රොහණං රට්ඨං භික්ඛුසංඝං ච සාසනං.
(ම.ව.79; 5-6)

එසේම මණිමේඛල රටෙහි (මිණිපේ) ගංගාදෙණි නම් ස්ථානයේ සංඛ නම් සෙනෙවියා නගරයක් ඉදිකොට යොදුන් දෙකක් දුරින් සිටි මාඝ සේනාව තණපත් තරමට හෝ නොසලකමින් ඔවුන් වළක්වමින් රට ද සසුන ද ආරක්ෂා කළේ ය.

තිණායපි න මඤ්ඤන්තො සඞඛනාමො චමූපතී
නිබ්භීතිකොව රක්ඛිත්ථ තං රට්ඨං තඤ්ච සාසනං
(ම.ව. 79; 7-9)

මේ අතර සිරිසඟබෝ රජ පරපුරෙන් පැමිණි විජයබාහු නම් රජෙක්, සතුරු බිය හේතුවෙන් වනගත දුර්ගවල සැඟව සිට වන්නිරාජත්වයට පත්ව සිංහල ඇමතිවරුන් සියලු දෙන අවනත කොට මාඝ සේනා දුරුකොට මායා රට දඹදෙණි පර්වතය මුදුනෙහි ආරක්ෂිත නගරයක් ඉදිකොට එහි වාසය කළේ ය. (ම.ව.79; 10-16)

මේ අනුව අස්ථාවර දේශපාලන තත්ත්වය ද, ආර්ථික පරිහානිය ද හේතු කොටගෙන දුර්වල වෙමින් පැවති පොළොන්නරු රාජධානියේ බිඳවැටීම කාලිංග මාඝ ආක්‍රමණය නිසා වේගවත් වීමෙන් රජරට වියළි කලාපීය රාජධානි අවසන් වී ය. දඹදෙණිය රාජධානිය පිහිටුවීමෙන් පසුව, යාපහුව හැර අන් රාජධානි සියල්ල ම තෙත් කලාපයට, විශේෂයෙන් නිරිතදිග කලාපයට අයත් වූ අතර තෙත් කලාපයේදී වී වගාව ඇතුළු ධාන්‍ය වර්ග පදනම් කරගත් ස්වයංපෝෂිත යැපුම් කෘෂිකර්මාන්තයට වඩා අපනයන භෝග කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ය. එමගින් මෙරට ආර්ථිකයට සිදු වූ අහිතකර බලපෑම වර්තමානය දක්වාම යථා තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*ඌනපූරණසහිතො මහාවංසො;* (සංස්) බුද්ධදත්ත ථෙර, පොල්වත්තේ, (1959) ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

*පූජාවලිය;* (සංස්) සුරවීර, ඒ.වී. සහ තවත් අය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවඃ (2014) කොළඹ.

ලියනගමගේ, අමරදාස. *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*; අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, (1989) කොළඹ.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය; පළමු කාණ්ඩය, දෙවන භාගය*; විද්‍යාලංකාර පරිවර්තනය. (1971)

*Epigraphia Zeylanica,Vol. II*, (1912-1927), (ed.), Wickramasingha, D.M.D.Z., London: Oxford University press.